# "ගසක මහිම"

මහාරණ

## පියසිලි ගුණසේකර සුමනරත්න

විල් වැව් ගඟ දියෙහි ඒකවරණයට පොදු
ගල් වා නිමල සිසිලස හිම කිරණ බෙදූ
මල් මය සුවඳ විහිදු අතු පතර මදූ
නිල් ලොව සරසවන ගස සුරතුරක බඳු

ඝරු පස සුළුක දී මිහිලිය ගතට සවී
දුරු කර නියඟ තාපය මිහිමතම වැවී
කිරුළක විලස ජාතියෙ පින පිණිස මැවී
නිරු දක කතර මැද වුව සුව සෙවන හෙවී

සැඩ රිවි කිරණ සතපා සිසිලසින් අමා
හැඩ වී නිබඳ තුරුපත් රන් සළුව නමා
සත සිත සුවය පිළිබඳ මෙහෙවරට පමා
නොම වන ඔබගෙ මෙත් ගුණ කළ නොහැක නිමා

ඝුඹ කුස විසිර යන නල ඒලක ඔප කර
හෙබ වූ දසත ඒහුමක සිරිනි මන හර
දඹ රන් කැරළි විලසට පැළඳ පල බර
ලැබ දුනි ඉසුරු සත වෙත ඔබගෙ පර පුර

මලකින් සුවඳ මල් මුවරද මාල ගොතා
විලිකුන් පලය තිළිණය කොට මිහිර ඕතා
පිළිපන් ලොවෙහි ඔබ සත්වග සේවෙ පතා
සපුරන් නෙහිය නිහඬව දන පාර මිතා

අප දිවි මහට පිරිනම නම තිළිණ පොදී
සුව සෙත සදනා ලද සෙත්සිරි සෙවන දිදී
සුවිසල් මැදුර හෝ පැල්පත සමහ බැදී
සලසයි පරම සෙත නිති අප අතර රැදී

ගත දැඩි වෙහෙස විඳ සපැමිණි කල අපට
ලතැවුල් නිවා සුපසන් බව උරුම කොට
සැත පෙනු පිණිස වැද සුකවිහරණය කට
නෙත නිදි සුවය ලැබ දුනි යහනකව සිට

එළඹුනු කලද රෝබිය රුදු සතුරු කැල
පළ කර අනගි දිව ඔසුවක මහරු බල
කොළ මල් පලද යුස ලැබදී සියලු කල
කළ මෙහෙවරකි සත වෙත පා ඉඳුරු බල

සා පවසට මෙන්ම රස බොජුනට එක්වී
ද අළුවනු පිණිස වුව ගිනි සිළු වක්වී
සත් වග පැවතුමෙහි තුහු මෙහෙයට එක්වී
සබඳිනී නිබඳ ඔබ සහයෝගය දක්වී

මුදු කරුණා ගුණයෙ බලමහිමය පෙන්නා
කුර ගෑ දිවි ඉසව් තුළ ලබැදීව උන්නා
වෙර නැති කලද මනු දිවියෙහි තතු දන්නා
සැර යටියකව ඔබ අප හා පිය මැන්නා